**ශීර්ෂය 108 - තැපැල් සේවා අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**

---

මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.

1 කොටස - අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව

2 කොටස - එක් එක් ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව

## 1 කොටස

**තැපැල් සේවා අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**

---

1. අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු

| ශීර්ෂය | දෙපාර්තමේන්තුව |
| --- | --- |
| 308 | තැපැල් දෙපාර්තමේන්තුව |

02. ගිණුම්

2.1 විසර්ජන ගිණුම්

මුළු ප්‍රතිපාදනය හා වියදම

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. 9,252,480,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. 9,202,780,670 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් පිළිවෙලින් රු. 46,034,504 ත් රු. 3,664,826 ත් අතර ප්‍රමාණයක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 17 ක් හා සියයට 0.04 ක් විය. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | 2013 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | |
| 108 | 263,980,000 | 217,945,496 | 46,034,504 | 17.4 |
| 308 | 8,988,500,000 | 8,984,835,174 | 3,664,826 | 0.04 |
| එකතුව | 9,252,480,000 | 9,202,780,670 | 49,699,330 | 0.53 |

## 2.2 ආදායම් ගිණුම

ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම

අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුවවිසින් 2013 වර්ෂය සඳහා ආදායම් සංකේත 01 ක් සඳහා රු. මිලියන 4,650 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 5,907 ක ආදායමක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 127 ක් විය. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | 2013 දෙසැම්බර් 31 දිනට | | | ඉක්මවීම ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ආදායම ඉක්මවීම | |
| | රු. | රු. | රු | |
| 20-01-02-00 | 4,650,000,000 | 5,907,433,288 | 1,257,433,288 | 27 |

## 2.3 අත්තිකාරම් ගිණුම්

### 2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුවට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 10801 | 5,000,000 | 3,618,150 | 1,900,000 | 5,899,935 | 30,000,000 | 12,972,181 |
| 30801 | 700,000,000 | 647,668,786 | 480,000,000 | 564,997,741 | 2,700,000,000 | 1,765,042,937 |

## 2.4 අග්‍රිම හා පොදු තැන්පත් ගිණුම්

### 2.4.1 අග්‍රිම ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂ එකතුව රු. 713,752,397 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | අග්‍රිම ගිණුම් අංකය | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| තැපැල් සේවා අමාත්‍යාංශය | 7002-349-13 | 657,172 |
| තැපැල් දෙපාර්තමේන්තුව | 7002-0000-00-098-0012-000 | - |
| | 7002-0000-00-098-0013-000 | 713,095,225 |
| එකතුව | | 713,752,397 |

### 2.4.2 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු. 53,976,957 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තැන්පත් ගිණුම් අංකය | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| තැපැල් සේවා අමාත්‍යාංශය | 6000/0000/00/0015/0022/000 | 8,654,519 |
| තැපැල් දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0162/000 | 45,322,438 |
| එකතුව | | 53,976,957 |

## 2 කොටස

----------

**එක් එක් ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව**

**1. ශීර්ෂය 108 - තැපැල් සේවා අමාත්‍යාංශය**

**1.1 විගණන විෂය පථය**

තැපැල් සේවා අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 අගෝස්තු 07 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

1.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව තැපැල් සේවා අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.10 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) අයවැය විචලනය

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. එක් වැය විෂයයක් සඳහා සලසා තිබුණු රු. 100,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

ii. වැය විෂයයන් 06 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 8 සිට 61 දක්වා වූ පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

iii. අමාත්‍යාංශයේ අරමුණු ලඟාකර ගැනීම සඳහා අවශ්‍ය සැලසුම් සම්පාදනය කර එමගින් අවශ්‍යතාවයන් හඳුනාගෙන ඇස්තමේන්තු සකස් නොකිරීම නිසා වැය විෂයයන් 18 කරු. 5,311,000 ක ප්‍රතිපාදන මූ.රෙ. 66 මගින් වැය විෂයයන් 16 කට මාරුකර ගෙන තිබුණ අතර පරිපූරක ඇස්තමේන්තු මගින් වැය විෂයයන් 06 ක් සඳහා රු. 3,950,000 ක ප්‍රතිපාදනයක් සලසා ගෙන තිබුණි.

iv. වැය විෂයයන් 05ක රු.43,917,369ක ඉතිරිවීම් පිළිබඳව දක්වා තිබූ පැහැදිලි කිරීම් විගණනයට නිරීක්ෂණය වූ කරුණුවලට අනුව පිළිගත නොහැකි විය.

**(ආ) අග්‍රිම ගිණුම්**

**---------------**

2014 අප්‍රේල් 30 දින වන විට පියවා නොතිබුණු අග්‍රිම ශේෂ එකතුව රු. 645,815 ක් විය. මේ තුළ 2011 වර්ෂයට අදාල රු. 16,740ක ශේෂයක්ද 2012 වර්ෂයට අදාල රු. 4,075ක ශේෂයක්ද ඇතුලත් විය.

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

**---------------------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක 108011 දරන අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. 249,224 ක් වූ අතර එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. මෙම ශේෂයන්ගෙන් රු. 246,674 ක් අවුරුදු 05 ට වැඩි කාලයක සිට පැවත එන අතර රු. 2,550 ක් අවුරුදු 01 ත් 02 ත් අතර කාලයක සිට පැවතෙමින් තිබුණි.

(ii) ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණය ශේෂයක් ලෙස රු. 42,833 ක් දක්වා තිබුණු නමුත් එම ශේෂය ලබීමට ඇති ණය පිළිබඳ කාල විශ්ලේෂණයට ඇතුලත් කර නොතිබුණි.

(iii) 2013දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ පොත් අනුව පාලන ගිණුමේ ශේෂය රු. 10,633,926 ක් වූ අතර භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව ශේෂය රු. 10,129,610 ක් විය. මේ අනුව අමාත්‍යාංශයේ පොත් අනුව හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව රු. 534,316 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර මෙම වෙනස 2004 වර්ෂයේ සිට දිගින් දිගටම පවතින ශේෂයක් විය. එසේ වුවත් මෙකී වෙනස හඳුනාගෙන නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

(iv) 2013 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව රු. 11,558,493 ක් වූ අතර පාලන ගිණුම අනුව ශේෂය රු. 10,663,926 ක් විය. ඒ අනුව රු. 894,567 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එම වෙනස හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 1.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 1.4.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර තිබුණේ 2013 පෙබරවාරි 07 දිනදීය.

### 1.4.2 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 අභ්‍යන්තර විගණන සැලැස්ම මගින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ පහත දැක්වෙන විගණන කාර්යයන් සිදුකර නොතිබුණි.

(i) මූලධන වත්කම් අත්පත්කර ගැනීම කාර්යාලීය උපකරණ හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම පරීක්ෂා කිරීම

(ii) මුද්දර ප්‍රවර්ධන කටයුතු අපේක්ෂිත කාර්යයන් හා ඉලක්ක ඉටුකර තිබේදැයි පරීක්ෂා කිරීම

(iii) තැපැල් ජාලය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය පරීක්ෂා කිරීම

(iv) පෞද්ගලික ලිපිගොනු පරික්ෂා කිරීම.

(v) මානව සම්පත් සංවර්ධනය අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය පුහුණු කිරීම පරීක්ෂා කිරීම

(vi) ප්‍රසම්පාදන කටයුතු සමාලෝචනය

(ආ) 2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009(1) දරන විගණන හා කළමනාකරණ දෙපාර්තමේන්තු චක්‍රලේඛයෙහි විධිවිධාන ප්‍රකාරව පද්ධති විගණනයක් සිදුකර අභ්‍යන්තර පාලන ක්‍රම ශක්තිමත් කිරීමට දායක වී නොතිබුණි.

(ඇ) අභ්‍යන්තර විගණන නිලධාරීන් ලෙස බඳවාගෙන තිබූ නිලධාරීන් උපාධිධාරී අභ්‍යාසලාභී නිලධාරීන් වූ අතර ඔවුන්ගේ දැනුම, කුසලතාවය, වගකීම හා වෘත්තීය ආචාර ධර්ම සම්බන්ධව ප්‍රමාණවත් පුහුණුවක් ලබාදීම සඳහා අභ්‍යන්තර හෝ බාහිර පුහුණු සැසිවාර පවත්වා නොතිබුණි.

(ඈ) අභ්‍යන්තර විගණන අංශයේ අනුමත කාර්ය මණ්ඩලය විගණන සහකාර නිලධාරීන් 05 ක් වන නමුත් තථ්‍යප්‍රමාණය 04 ක් විය.

## 1.5 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරුනු ලැබේ.

### (අ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම

උඩරට සංවර්ධන ඒකකයට අයත්ව තිබූ වාහනයක් පවරාගැනීමකින් තොරව අමාත්‍යාංශය විසින් පාවිච්චි කරනු ලබයි.

### (ආ) ජංගම නොවන වත්කම් අපහරණය කිරීම

2004 වර්ෂයෙන් පසු මිලදී ගත් 2013 වර්ෂය තුළ අපහරණය කරන ලද වාහන දෙකක (02) පිරිවැය අපහරණය කිරීම් යටතේ දැක්විය යුතු වුවත් එම වාහන දෙකෙහි (02) විකුණුම් වටිනාකම වූ රු. 1,657,400 වර්ෂය තුළ අපහරණය කිරීම් යටතේ දක්වා තිබුණි.

### (ඇ) බේරුම් නොකළ බැරකම්

අමාත්‍යාංශය විසින් මුදල් රෙගුලාසි 94(i) ප්‍රකාර බැරකම් වලට බැඳිය යුත්තේ පවත්නා වර්ෂයේ ප්‍රතිපාදනය කළ මුදල් ඒ සඳහා ප්‍රමාණවත් වනවිටදී පමණක් වුවද 2013 වර්ෂයේදී ප්‍රතිපාදිත මුදල් සීමාව ඉක්මවා වැය විෂයයන් 18 ක් සඳහා රු. 1,600,375 ක මුදලකින් බැරකම් ඇතිකරගෙන තිබූ අතර එම වියදම් 2014 වර්ෂයේ ප්‍රතිපාදනවලින් පියවා තිබුණි.

## 1.6 අනුකූල නොවීම්

### (අ) නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (i) | 1997 සැප්තැම්බර් 30 දිනැති අංක 353(3) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ (ii) ඡේදය | 13,383,462 | සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් වාහන 10 ක් අපහරණය කර තිබුණද තක්සේරු වාර්තාව සමඟ තත්ත්ව වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) | 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය | 41,996,012 | බාර්කෝඩ් කියවන යන්ත්‍ර මිලදී ගැනීම හා පරිගණක 275 ක් හා ඊට අදාල උපාංග මිලදී ගැනීම රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් අනුමත කරන ලද ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කර නොතිබුණි. |

**1.7 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා**

**තැපැල් කාර්යාල ජාලගත කිරීමේ ව්‍යාපෘතිය**

තැපැල් කාර්යාල ජාලගත කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2007 ඔක්තෝබර් 31 දිනැති අංක 12/2007 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය ප්‍රකාර ආදායම් එකතු කිරීමේ විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම, නව ව්‍යාපාර කටයුතුවලින් ආදායම ඉපයීමේ ක්‍රමෝපායන් ස්ථාපිත කිරීම, තැපැල් දෙපාර්තමේන්තුව දිගින් දිගටම අලාභ ලැබීම වලක්වා ගෙන ආදායම හා වියදම සම තත්ත්වයේ පවත්වාගෙන යාම හා අරමුණු ලඟාකර ගැනීමට අපේක්ෂා කර තිබුණි. මේ පිළිබඳව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු. මිලියන 300 ඇස්තමේන්තු ගත පිරිවැයක් සහිතව 2008 වර්ෂයේදී ආරම්භ කර තිබූ මෙම ව්‍යාපෘතිය 2012 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. එසේ වුවත් 2014 වර්ෂයේ මාර්තු 31 දින වන විටත් නිම කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී ව්‍යාපෘති කටයුතු සඳහා වැය කිරීමට ඇස්තමේන්තු කළ මුදල රු. මිලියන 165 ක් වුවද එයින් රු. මිලියන 125.41 ක් එනම් ඇස්තමේන්තුගත පිරිවැයෙන් සියයට 76 ක් පමණක් වැය කර තිබුණි.

(ඇ) ව්‍යාපෘතියේ ප්‍රධාන කාර්යයන් දෙකක් වන දත්ත මධ්‍යස්ථාන ඇතිකිරීම සහ ආපදා ප්‍රතිසාධන ඒකක පහසුකම් ස්ථාපනය කිරීම සිදුකර නොතිබුණි. මොරටුව විශ්ව විද්‍යාලයේ උපදේශකත්වය යටතේ ලබාගැනීමට නියමිත වූ මොඩියුල 16 ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේ ගැටළු මත නවතා දැමීමට කටයුතු කළ බවත් දත්ත මධ්‍යස්ථානය ඉදිකිරීම වෙනුවට දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ අංශය ශක්තිමත් කර අඩු වියදමකින් අදාල පහසුකම ලබාගැනීමට කටයුතු කරන බවත් 2014 අගෝස්තු 21 දින විගණනය වෙත දන්වා තිබුණු නමුත් අදාල කටයුතු 2014 දෙසැම්බර් මාසය දක්වාම ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) මෙම ව්‍යාපෘතිය තුලින් තැපැල් දෙපාර්තමේන්තුව දිගින් දිගටම අලාභ ලැබීම වලක්වා ආදායම හා වියදම සම තත්ත්වයේ පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් වූ අරමුණ සමාලෝචිත වර්ෂය තුළදීද ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි. 2013 වර්ෂයේදී රු. මිලියන 2,859ක අලාභයක් දෙපාර්තමේන්තුව ලබා තිබුණි.

## 1.8 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

ජනාධිපති ලේකම් කාර්යාලයේ 2010 මැයි 14 දිනැති අංක සීඑ/1/17/1 දරන චක්‍රලේඛයට අනුව රාජ්‍ය ආයතන වෙත ලැබෙන මුදල් ප්‍රතිපාදන අරපරිස්සමින් හා උපරිම කාර්යක්ෂමතාවයෙන් පරිහරණය කිරීම සඳහා රාජ්‍ය ආයතන රජයට අයත් ගොඩනැගිලි තුල හැකිතාත් දුරට පවත්වා ගත යුතු බව පෙන්වා දී තිබියදී මූලස්ථාන ගොඩනැගිල්ලේ පවත්වා ගෙන ගිය නියෝජ්‍ය අමාත්‍ය කාර්යාලය සඳහා පුද්ගලික ගොඩනැගිල්ලක් රු. 500,000 ක මාසික කුලියකට 2013 නොවැම්බර් 18 දින මිල කැඳවීමකින් තොරව ලබාගෙන තිබුණි.

## 1.9 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

2008 සැප්තැම්බර් 01 දිනට පැවති රු. 815,000 ක ගබඩාවේ තොග ඌනතාවයෙන් නිලධාරීන් දෙදෙනෙකුගෙන් රු. 271,668 ක් වාරික වශයෙන් අයකර ගැනීමට තීරණය කර 2013 දෙසැම්බර් 31 දින වන විට එයින් රු. 57,729ක් අයකර ගෙන තිබුණි. ඉතිරි රු. 543,332ක මුදල අයකර ගත යුතු නිලධාරිණියගෙන් 2013 දෙසැම්බර් 31 දින වන විට කිසිඳු මුදලක් අයකරගෙන නොතිබුණි.

## 1.10 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදිවිය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 12 | 12 | - |
| තෘතීයික මට්ටම | 03 | 02 | 01 |
| ද්විතික මට්ටම | 52 | 45 | 07 |
| ප්‍රාථමික මට්ටම | 28 | 25 | 03 |
| වෙනත් (අනියම්) | 04 | 03 | 01 |
| එකතුව | 99 | 87 | 12 |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වනවිට පුරප්පාඩු 12 ක් පිරවීමට අපොහොසත් වී තිබුණි.

## 2 ශීර්ෂය 308 - තැපැල් දෙපාර්තමේන්තුව

## 2.1 විගණන විෂය පථය

තැපැල් දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 සැප්තැම්බර් 05 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

## 2.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව තැපැල් දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 2.4 සිට 2.13 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) අයවැය විචලනය**

**--------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් වැය විෂයයන් 11කට අදාල රු. 59,020,900ක ප්‍රතිපාදන මු.රෙ. 66 මගින් වෙනත් වැය විෂයයන්ට මාරුකර තිබුණි.

**(ආ) පොදු තැන්පත් ගිණුම**

**-----------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වර්ෂ 2 ඉක්ම වූ රු. 34,707,258 ක් වූ තැන්පතු 140 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) විශ්ව තැපැල් අරමුදලින් 2011 වර්ෂයේදී ලබාදී තිබුණ රු. 27,255,850 ක මුදල අදාල කාර්යය භාරයන් ඉටු නොකර තැන්පත් ගිණුමෙහි රඳවාගෙන තිබුණ අතර එයින් රු. 4,319,665 ක මුදලක් උපයෝජනයකින් තොරව 2014 පෙබරවාරි 03 දින විශ්ව තැපැල් සංගමයට ආපසු යවා තිබුණි.

**(ඇ) ආදායම් ගිණුම**

**-----------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉදිරිපත් කළ ආදායම් ගිණුමට අනුව එකතුව රු. 112,721,537 ක් වූ ආදායම් හිඟ හිට තිබුණ අතර එම හිඟ හිටි ආදායම් වර්ෂ 01 සිට වර්ෂ 06 ක් අතර කාල පරාසයකට අදාල විය. එම හිඟ හිටි ආදායම් අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ii) 2013 දෙසැම්බර් 31 දිනට වූ හිඟ ආදායම් වාර්තාවෙහි “විදුලි බිල්පත් කොමිස්” හිඟ ආදායම රු. 61,942,522 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ව්‍යාපාරික තැපැල් අංශය මගින් විගණනය සඳහා ලබාදුන් ව්‍යාපාරික තැපැල් හිඟ ආදායම රු. 61,071,857 ක් වුවද එය රු. 21,642,176 ක් ලෙස ගිණුම් ගතකර තිබුණි.

(iv) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තොග තැපැල් හිඟ ආදායම හා නිදහස් තැපැල් හිඟ ආදායම පිළිවෙලින් රු. 14,388,168 ක් හා රු. 139,727,846 ක් ලෙස එකතුව රු. 154,116,014 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(v) 2009, 2010, 2011 හා 2012 වර්ෂවලට අදාලව එකතුව රු. 179,579,667 ක් ජාත්‍යන්තර තැපැල් හිඟ ආදායම ලෙස සමාලෝචිත වර්ෂයේදී හඳුනාගෙන ගැලපීම් කර තිබුණි. මේ හේතුවෙන් ජාත්‍යන්තර තැපැල් හිඟ ආදායම ලෙස

වර්ෂය අවසානයේදී අනාවරණය කරන අගය, තාත්වික නොවන බව විගණනයේදී නිරීක්ෂණය විය.

(vii) සන්නිවේදන පියස්වල ලාභය ගණනය කර එම ආදායම ආදායම් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට 2013 දෙසැම්බර් 31 දිනට රු. 35,262,146 ක් විවිධ තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. ගම්පහ සන්නිවේදන පියසේ ආදායම පමණක් එනම් රු. 63,240 ක් ආදායම් ලෙස ගිණුම් ගතකර තිබුණි.

**(ඈ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

--------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක 30801 දරන අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු වර්ෂ 03 ට වැඩි ශේෂවල එකතුව රු. 30,431,469 ක් වූ අතර එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමට ආයතනය අපොහොසත් වී තිබුණි.

(ii) කළුතර දිසා ගිණුම් කාර්යාලයේ ණය අත්කිකාරම් ගෙවීමේදී සිදුකර තිබූ රු. 290,000ක මුදල් වංචාව කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ අනාවරණය නොකිරීම නිසා 2013 දෙසැම්බර් 31 දිනට හර ශේෂය එම ගණනින් වැඩියෙන් එනම් රු. 1,765,283,132ක් ලෙස පෙන්වා තිබුණි.

(iii) මඩකලපුව දිසා ගිණුම් කාර්යාලයේ කේවල ශේෂය හා පාලන ගිණුම් ශේෂය අතර වෙනස රු. 258,262 ක් විය.

## 2.4 යහපාලනයහාගිණුම්කටයුතුභාවය

-------------------------------------

### 2.4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

----------------------------

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදනයන් පමණක් නියෝජනය වන පරිදි ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඉදිරිපත් කර තිබුණි.

### 2.4.2 අභ්‍යන්තර විගණනය

-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයට අදාලව අභ්‍යන්තර විගණන අංශය මගින් පිළියෙල කරන ලද විගණන වැඩසටහනෙහි ඇතුලත් මධ්‍යම තැපැල් හුවමාරුවේ ව්‍යාපාරික තැපැල් ආදායම පරීක්ෂාව, තැපැල් මුද්‍රා යන්ත්‍ර අංශයේ පරීක්ෂාව, ජාත්‍යන්තර තැපැල් කටයුතු, ලියාපදිංචි ලිපි අංශයේ කටයුතු හා ගිණුම් අංශයේ කටයුතු පරීක්ෂා කිරීම සිදුකර නොතිබුණි.

(ආ) අභ්‍යන්තර විගණන අංශයේ වැඩ බෙදීම් හා ඒ ඒ නිලධාරීන්ගේ වගකීම් දැක්වෙන ආකාරයට ක්‍රියාපටිපාටි සංග්‍රහයක් (Procedure Manual) පවත්වා ගෙන ගොස් නොතිබුණි.

(ඇ) අභ්‍යන්තර විගණන අංශයේ තැපැල් ගිණුම් පරීක්ෂණ නිලධාරීන් 29 දෙනෙකුගේ හා සහකාර තැපැල් ගිණුම් පරීක්ෂකවරුන් 35 දෙනෙකුගේ පුරප්පාඩු පවතින බව නිරීක්ෂණය වූ අතර පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම එම අංශයේ කාර්යය සාධනය දුර්වල වීමට බලපා තිබුණි.

(ඈ) 2013 වර්ෂය හා ඊට පෙර වර්ෂවල නිකුත් කරන ලද එහෙත් 2014 ඔක්තෝබර් 07 දිනට පිළිතුරු නොලද අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැණුනු අභ්‍යන්තර විගණන විමසුම් සංඛ්‍යාව 38 කි.

## 2.5 වත්කම්කළමනාකරණය

### (අ) නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිශ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | වත්කම් වර්ගය | ඒකක ගණන | නිශ්ක්‍රීය හෝ ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|---|
| (i) | ගොඩනැගිලි | 01 | අවුරුදු 01 |
| | | 08 | ගණනය කළ නොහැකිය. |
| (ii) | යන්ත්‍ර සූත්‍ර | 03 | අවුරුදු 07 |
| | | 04 | අවුරුදු 04 |
| | | 01 | අවුරුදු 01 |
| | | 359 | ගණනය කළ නොහැකිය. |
| (iii) | වෙනත් | 24 | ගණනය කළ නොහැකිය. |

### (ආ) බැරකම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මු.රෙ. 94(1) ප්‍රකාරව ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට නොබැඳිය යුතු නමුත් වැය විෂයයන් 11 කට අදාලව එක් එක් වැය විෂයය සඳහා වූ ප්‍රතිපාදන ඉතිරිවීම් ඉක්මවා රු. 111,284,811 ක බැරකම්වලට බැඳීම් ඇතිකරගෙන තිබුණි.

(ii) 2013 වර්ෂය වෙනුවෙන් 2014 වර්ෂයේ ගෙවන ලද රු. 13,016,745 ක් වටිනා බැරකම්, බැරකම් ප්‍රකාශයේ ඇතුලත් කර නොතිබුණි.

**2.6 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | |
| | (i) viii පරිච්ඡේදයේ 6.1 වගන්තිය | | මාසික වැටුප් ලබන නිලධාරියකුගේ දිනක වැටුප ගණන් බැලිය යුත්තේ ඒකාබද්ධ මාසික වැටුපෙන් 1/30 ක වටිනාකම වුවත් අතිකාල ගෙවීමේදී ඒකාබද්ධ මාසික වැටුප 1/30 කට අමතර 25% ක දීමනාවක්ද එකතුකර ගෙවීම් කර තිබුණි. |
| | (ii) viii පරිච්ඡේදයේ 7.2 වගන්තිය | | යම් නිලධාරියකුට මසකට පැය 20 සීමාව ඉක්මවා අතිකාල දීමනා ගෙවීම සඳහා බලය දීමට අදාල අමාත්‍යාංශයේ ලේකම්වරයාට හැකි වුවත් පැය 20 සීමාව ඉක්මවා සිදු කරන ලද අතිකාල සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණු බව කාර්යාල දෙකක සිදු කරන ලද නියැදි පරීක්ෂණයේදී අනාවරණය විය. |
| (ආ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | |
| | (i) 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන චක්‍රලේඛය | | ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍රයක් මගින් පැමිණීම හා පිටවීම සටහන් කිරීමට කටයුතු කළ යුතු වුවත් 40 කට අධික සේවක සංඛ්‍යාවක් සිටින කාර්යාල තුනක එසේ ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතා නොකරන බව නිරීක්ෂණය විය. |
| | (ii) 2011 දෙසැම්බර් 30 දිනැති අංක 6/2004(1) දරන | 2,900,000 | හැවුලොක් ටවුම හිටපු තැපැල් ස්ථානාධිපතිවරයා රු. මිලියන 2.9 කට අධික මුදලක් වංචා කිරීම හේතුවෙන් තැපැල් සේවා |

| | | |
|---|---|---|
| චක්‍රලේඛයේ 02 ඡේදය | | ලේකම්ගේ MPS/ADM/3/12/37 හා 2013 ජනවාරි 30 දිනැති ලිපියෙන් වැඩ තහනම් කර තිබුණද 2013 ජූලි 04 දිනැති ජ්‍යෙෂ්ඨ පාලන ලේකම් මූලස්ථාන ලිපියෙන් ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ 31.11 වගන්තිය යටතට ගැනෙන විෂමාචාරයන් සිදුකර තිබියදී නැවත සේවයේ පිහිටුවා තිබුණි. |
| (ඇ) භාණ්ඩාගාර චක්‍රලේඛ<br>------------------------- | | |
| 2012 ජූලි 17 දිනැති අංක 1/2002 චක්‍රලේඛයේ 07ඡේදය | | ත්‍රෛමාසික ආදායම් වාර්තා එම කාල සීමාව අවසන් වූ දින සිට දින 15 ක් ඇතුලත රාජ්‍ය මුදල් ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු වුවද දින 06 සිට දින 48 දක්වා කාල ප්‍රමාදයකින් පසුව එම වාර්තා ඉදිරිපත් කර තිබුණි. |
| (ඈ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ<br>------------------------- | | |
| 2010 සැප්තැම්බර් 01 දිනැති චක්‍රලේඛ අංක 446 ට අනුව හා තැපැල්පති විසින් නිකුත් කර ඇති 2010 නොවැම්බර් 02 දිනැති අංක 19/16/දුරකථන/58 හා 2010 දරන චක්‍රලේඛය | 160,389 | රාජකාරී දුරකථන භාවිතා කරන නිලධාරීන් සඳහා නිලධාරීන්ට පනවා ඇති සීමාව ඉක්මවන විට එම නිලධාරීන්ගේ වැටුපෙන් අයකළ යුතු බව දන්වා ඇතත් නිලධාරීන් 08 දෙනෙකුගෙන් අයවිය යුතු සීමාව ඉක්මවූ දුරකථන ගාස්තු අයකර නොතිබුණි. |
| (ඉ) තැපැල්පති චක්‍රලේඛ<br>------------------------ | | |
| (i) PF1/15/2009 හා 2009 ජූලි 30 දිනැති චක්‍රලේඛය | 105,235 | රාජ්‍ය ආයතනවලට නිදහස් තැපැල් පහසුකම් සැපයීමේදී වාර්ෂික ප්‍රතිපාදනය ඉක්මවීම නොකළ යුතු වුවත් පොලොන්නරුව තැපැල් කාර්යාලය විසින් එම සීමාව ඉක්මවා නිදහස් තැපැල් පහසුකම් ලබාදී තිබුණි. |
| (ii) 14/2000 ගිණුම්හා 2000 නොවැම්බර් 07 දිනැතිචක්‍රලේඛයේ 4.1 ඡේදය | | සෑම මසක් අවසානයේදීම අත ඉතිරි තොග ප්‍රමාණය මෙන්ම වටිනාකම දැක්වෙන ආකාරයට තොග ආගණනය කළ යුතු වුවත් නියැදි විගණන පරීක්ෂණයට අනුව සන්නිවේදන පියස් 02 ක ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (iii) එම 7 ඡේදය | සෑම මසක් අවසානයේදීම ශේෂ පිරිස්සුමක්, ලාභාලාභ ගිණුමක් හා ශේෂ පත්‍රයක් පිළියෙල කළ යුතු වුවත් නියැදි විගණන පරීක්ෂණයට අනුව සන්නිවේදන පියස් 04 ක ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (iv) 2001 දෙසැම්බර් 10 දිනැති නියෝජ්‍ය තැපැල්පතිගේ අංක දිගි/කොළතැ.යො/1 /2001 ලිපිය | සෑම හය මසකට වරක්ම ප්‍රාදේශීය තැපැල් අධිකාරීගේ අධීක්ෂණය යටතේ භෞතික තොග ගණන් ගැනීමක් කළ යුතු වුවත් නියැදි විගණන පරීක්ෂණයට අනුව සන්නිවේදන පියස් 04 ක ඒ අනුව කටයුතු කර නොතිබුණි |

## 2.7 කාර්යයසාධනය

2013 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

### (අ) වාර්ෂික ආදායම

තැපැල් දෙපාර්තමේන්තුව විසින් උපයන ලද ආදායම, දැරූ වියදම පසුගිය වර්ෂය හා සසඳා පහත දැක්වේ.

| විස්තරය | 2012 | 2013 | වැඩිවීම/ (අඩුවීම) ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| | රු. මිලියන | රු.මිලියන | |
| ආදායම | 4,952 | 5,907 | 19 |
| වියදම | 8,258 | 8,766 | 6.1 |
| මෙහෙයුම් ඌනතාවය | 3,306 | 2,859 | (13.5) |

(i) පසුගිය වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ ආදායම පසුගිය වර්ෂයට සාපේක්ෂව රු. මිලියන 955 කින්හෙවත් සියයට 19 කින් වැඩි වී තිබුණි. මෙහෙයුම් ඌනතාවය සියයට 14 කින් අඩුවී තිබුණි. මුද්දර ආදායම, ජාත්‍යන්තර තැපැල් ආදායම, විදුලි බිල්පත් ආදායම, තොග හා ව්‍යාපාරික තැපැල් ආදායම ඉහළ යාම මෙම ආදායම් වැඩිවීමට හේතුවී තිබුණි.

(ii) එසේ වුවද දෙපාර්තමේන්තුව සෘජුවම දායකවන ආදායම් විෂයයන් 04 කඑනම් ගබඩා ගාස්තු, සීඝ්‍රගාමී තැපැල, ලිපි එකතු කිරීමේ ගාස්තු හා සන්නිවේදන

පියස්වල ආදායම පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 17 සිට සියයට 40 දක්වා පරාසයකින් අඩුවී තිබුණි.

(iii) 2007 වර්ෂයේදී ආරම්භ කර තිබූ තැපැල්කාර්යාලජාලගත ව්‍යාපෘතියෙහි අරමුණුවලින් එක් අරමුණක් වනුයේ තැපැල් දෙපාර්තමේන්තුව දිගින් දිගටම අලාභ ලැබීම වලක්වා ආදායම හා වියදම සම තත්ත්වයේ පවත්වාගෙන යාමයි. නමුත්දෙපාර්තමේන්තුව සමාලෝචිත වර්ෂය තුළදී දලබා තිබුණ මෙහෙයුම් ඌනතාවයරු. මිලියන 2,859ක් විය.

**(ආ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු නොකර තිබූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) බත්තරමුල්ල තැපැල් බලප්‍රදේශය තුළ රජයේ ආයතන 70 ක් හා පෞද්ගලික ආයතන 28 ක් පැවතියද එම කාර්යාලවලට ලිපි බෙදීම සඳහා වූ විශේෂිත වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. මෙම කාර්යාලවලටද සාමාන්‍ය තැපැල් බලප්‍රදේශවලට ලිපි බෙදාහරින ආකාරයට ලිපි බෙදා හැරීමට කටයුතු සිදුකර තිබුණි. මේ හේතුවෙන් කාර්යාලවලට ප්‍රමාදයන් සහිතව ලිපි ලැබී තිබුණි.

(ii) බත්තරමුල්ල තැපැල් කාර්යාලය මගින් බෙදාහරිනු ලබන ලිපි ඇතැම් දිනවල ප්‍රමාදයකින් යුක්ත බව නිරීක්ෂණය විය. තැපැල් කරුවන්ගේ හිඟය හේතුවෙන් ඔවුන් නිවාඩු ලබාගත් දිනයන්හි ලිපි බෙදාහැරීම සිදුකර නොතිබුණි.

(iii) තැපැල් දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන තැපැල් කාර්යාල හා අනෙකුත් අංශයන්හි සිදුවී තිබෙන අක්‍රමිකතා පිළිබඳව පරීක්ෂා කර වගකිව යුතු නිලධාරීන් කවුරුන්ද යන්න තීරණය කිරීම විමර්ශන අංශයේ මූලික කාර්යභාරය වුවත් මෙම කටයුතු මන්දගාමීව සිදුකරන බව නිරීක්ෂණය විය. තැපැල් කාර්යාල 04 ක සිදුවී තිබූ රු. 8,613,000 ක වංචාවන් සම්බන්ධයෙන් සිදු කරන ලද විමර්ශන කටයුතු දැනටමත් වසර 03 සිට වසර 13 දක්වා කාල ප්‍රමාදයකින් යුතුව සිදු කෙරෙමින් පවතින බව නියැදි පරීක්ෂණයේදී අනාවරණය විය.

(iv) විමර්ශන නිලධාරීන් වෙත 2012 හා 2013 වර්ෂයන්හි භාරදුන් සිද්ධීන් 200 ක් වූ අතර එම සිද්ධීන්ගෙන් සිද්ධීන් 09 ක්පමණක් 2013 සැප්තැම්බර් 05 දින වනවිට සම්පූර්ණයෙන් නිමකර තිබුණි. ඒ අනුව පරීක්ෂණ නිම නොවූ සිද්ධීන් සංඛ්‍යාව 191 ක් විය. මේ හේතුවෙන් දෙපාර්තමේන්තුවේ වත්කම්වලට හා කීර්ති නාමයට සිදුවූ හානි නැවත ප්‍රතිෂ්ඨාපනය කරගැනීමට නොහැකිවීමෙන් එය දෙපාර්තමේන්තුවේ අපේක්ෂිත ඉලක්කය වෙත ළඟාවීමටද බාධාවක් වී තිබුණි.

**(ඇ) සැලසුම් කිරීම**

**වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියා නොකිරීම**

පහත සඳහන් අවස්ථාවලදී ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියා නොකර තිබුණු බව නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුලත් කර තිබූ අළුත්වැඩියා කිරීම් හා වැඩිදියුණු කිරීම් කටයුතු 10 ක් සිදුකර නොතිබූ අතර සැලැස්මට ඇතුලත් නොවූ අයිතම් 63 ක අළුත්වැඩියා හා වැඩිදියුණු කිරීම් සිදුකර තිබුණි. මීට අමතරව සැලැස්මෙහි ඇතුලත් නොවූ වෑන් රථ 20 ක් හා බයිසිකල් 20 ක් මිලදී ගෙන තිබුණි.

(ii) ප්‍රධාන කාර්යාලය යටතේ ගොඩනැගිලි පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම සඳහා රු. මිලියන 2.05 ක් වෙන්කර තිබූ අතර සිදුකරනු ලබන කාර්යයන් මොනවාද යන්න ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුලත් කර නොතිබුණි. ප්‍රගති වාර්තාව අනුව රු. මිලියන 16.988 ක් වැය කොට කාර්යයන් 32 ක් සිදුකර තිබුණි.

## 2.8 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

**(අ) ගැලපුම් කළ යුතු ශේෂ**

තැපැල් දෙපාර්තමේන්තුව විසින් 2013 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව අනාවරණය වූ තොරතුරු පහත දැක්වේ.

| | ගැලපුම් පිළිබඳ විස්තරය | කාල විශ්ලේෂණය | | | එකතුව |
|---|---|---|---|---|---|
| | | මාස06 ට වැඩි 01 ට අඩු | වර්ෂ 01 ට වැඩි 03 ට අඩු | වර්ෂ 03 ට වැඩි | |
| | | රු. | රු. | රු. | රු. |
| (i) | උපලබ්ධි නොවූ තැන්පතු | 152,878 | 276,586 | 500,100 | 929,564 |
| (ii) | නිකුත්කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් | 32,629 | 20,599 | 760 | 53,988 |
| (iii) | හඳුනා නොගත් හර | 2,299 | 319 | 50,000 | 52,618 |

| | | | | |
|---|---|---|---|---|
| (iv) හඳුනා නොගත් බැර | 4,066,640 | - | - | 4,066,640 |
| | 4,254,446 | 347,504 | 500,860 | 5,102,810 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2013 දෙසැම්බර් 31 දිනට නිකුත් කරන ලද නමුත් මාස 06 ඉක්මවීමෙන් පසුවද ගෙවීම් සඳහා ඉදිරිපත් නොවූ රු. 53,988 ක වටිනාකමින් යුත් චෙක්පත් 20 ක් සම්බන්ධව මු.රෙ. 396 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) දිසා ගිණුම් කාර්යාලවල ජංගම ගිණුම් 06 ක තැන්පත් කල නමුත් මාස 06 ඉක්මවීමෙන් පසුවද උපලබ්ධි නොවූ රු. 929,564 ක වටිනාකමින් යුතු තැන්පතු 116 ක් උපලබ්ධි වී නොතිබුණි.

(iii) 2013 දෙසැම්බර් 31 දිනට බැංකු ගිණුම් 04 කට අදාලව රු. 4,066,640 ක ලැබීම් හඳුනාගෙන නොතිබුණි. මෙයින් රු. 3,962,607 ක් යාපනය දිසා ගිණුම් කාර්යාලයට අයත් විය.

(iv) 2013 දෙසැම්බර් 31 දිනට බැංකු ගිණුම් 04 කට අදාලව රු. 52,618 ක හර ශේෂයන් හඳුනා ගෙන නොතිබුණි. හඳුනා නොගත් හර ශේෂයන්ගෙන් අවුරුදු 03 ට වැඩි රු. 50,000 ක් විය.

**2.9 මතභේදයට තුඩුදෙන ගණුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

මහනුවර "කැන්ඩි සිටි සෙන්ටර්" තැපැල් කවුළුවේ ස්ථාපිත කර තිබූ අංක FR 0112 දරන මුද්දර මුද්‍රා යන්ත්‍රය 2013 සැප්තැම්බර් 14 දින සිට 2013 සැප්තැම්බර් 28 දක්වා කාලය තුළදී අනවසරයෙන් තැපැල් කාර්යාලයෙන් බැහැරට ගෙන ගොස් පාවිච්චි කිරීමට අදාල සිදුවීමෙහි වගකිවයුතු නිලධාරීන් හඳුනාගැනීම සහ තැපැල් දෙපාර්තමේන්තුවට සිදු වී ඇති අලාභය ගණනය කිරීම සම්බන්ධයෙන් විමර්ශනයක් සිදුකර අලාභය අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**2.10 අවිධිමත් ගනුදෙනු**

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොරවිය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

---

**(අ) ගුවන් තැපැල් සේවාව සඳහා කොන්ත්‍රාත්කරුවකු තෝරාගැනීම**

---

(i) කොන්ත්‍රාත්කාර සමාගම සමග ඇතිකරගත් ගිවිසුමඅනුව 2013 ජනවාරි 01 දින සිට ගුවන් තැපැල් සේවාව ක්‍රියාත්මක කළ යුතු වුවද තෝරාගත් සමාගම එම කාර්යය කිරීමට අපොහොසත් වී තිබුණි. අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මත මෙම කොන්ත්‍රාත්කරු තෝරාගනු ලැබුවද කොන්ත්‍රාත්කරු අදාල සේවාව සැපයීමට අපොහොසත් වීම පිළිබඳව අමාත්‍ය මණ්ඩලය දැනුවත් කර තිබුණේ 2013 දෙසැම්බර් 09 දිනදීය.

(ii) සමාගම සමඟ එළඹෙන ලද ගිවිසුම ප්‍රකාරව ක්‍රියාකර නොමැති බැවින් කොන්ත්‍රාත්තුව අවලංගු කර රු. මිලියන 20 වටිනාකමකින් යුත් කාර්ය සාධන බැඳුම්කරය මගින් සිදුවූ මූල්‍ය අලාභය පියවා ගැනීමට 2014 ජනවාරි 03 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර තිබුණද මෙතෙක් එය අයකර ගෙන නොතිබුණි. කාර්ය සාධන බැඳුම්කරය බැංකුව මගින් දෙපාර්තමේන්තුවට ගෙවීමට විරුද්ධව වාරණ නියෝගයක් එම ආයතනය උසාවියෙන් ලබාගෙන ඇති බැවින් එම මුදල අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(iii) 2006 ජනවාරි 25 දිනැති ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.11.4 හා 8.11.5 ඡේද ප්‍රකාරව කොන්ත්‍රාත්තුව පැහැර හැරීම හේතුවෙන් කොන්ත්‍රාත්කරුගේ නම අසාදු ලේඛන ගත කිරීම 2014 ඔක්තෝබර් 07 දින විටත් සිදුකර නොතිබුණි.

**(ආ) මන්නාරම සංචාරක නිවාසය අළුත්වැඩියාව**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සංචාරක නිවාසය අළුත්වැඩියාව සඳහා වූ කාර්යසාධන බැඳුම්කරයක් 2012 දෙසැම්බර් 01 දිනට පෙර ඉදිරිපත් කළ යුතු බව ප්‍රසම්පාදන ලිපි මගින් කොන්ත්‍රාත්කරු වෙත දන්වා තිබුණද කොන්ත්‍රාත්කරු විසින් කාර්යය සාධන බැඳුම්කරය ඉදිරිපත් කර තිබුනේ 2013 ජනවාරි 21 දිනදීය.

(ii) කොන්ත්‍රාත්තුව පිරිනැමීමේ ලිපිය අනුව ඉදිකිරීම් කටයුතු 2012 දෙසැම්බර් 12 දින ආරම්භකර 2013 ජනවාරි 31 දින නිමකිරීමට එකඟවී තිබුණද අදාල ඉදිකිරීම සම්බන්ධයෙන් වූ ගිවිසුම අත්සන්කර ඇත්තේ 2013 ජනවාරි 27 වන දිනදීය.

(iii) අළුත්වැඩියා කටයුතු 2014 ජනවාරි 08 දින වන විටත් නිමකර නොතිබුණි. මෙහිදී ගිවිසුමේ 6.4 ඡේදය ප්‍රකාරව ප්‍රමාද වූ දිනකට රු. 5,825 බැගින් කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 10 ක උපරිමයකට යටත්ව ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි.

(iv) කාර්යයසාධන බැඳුම්කරයේ කාලය 2013 මාර්තු 31 දිනෙන් අවසන් වී තිබුණද එම කාර්යයසාධන බැඳුම්කරයේ කාලය දීර්ඝ කර ගැනීමට කටයුතු කර

නොතිබුණි. මෙය 2006 ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8(b) ඡේදයේ විධිවිධාන උල්ලංඝණය කිරීමකි.

**(ඇ) අනුරාධපුර තැපැල් සංකීර්ණ ගොඩනැගිල්ල ඉදිකිරීම හා අවිස්සාවේල්ල තැපැල් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මෙම ඉදිකිරීම් තැපැල් දෙපාර්තමේන්තුව විසින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට භාරදී තිබුණද ඉදිකිරීම්වලට අදාලව තැපැල් දෙපාර්තමේන්තුව හා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව අතර ගිවිසුමකට එළඹී නොතිබුණි.

(ii) ඉදිකිරීමට යෝජිත ගොඩනැගිලිවල සැලැසුම් හා ඇස්තමේන්තු තැපැල් දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කර නොතිබුණි.

(iii) මෙම කොන්ත්‍රාත්තු සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව බාහිර කොන්ත්‍රාත්කරු සමග එළඹී ගිවිසුම් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(iv) රු. 90,544,820ක අරමුදල් මුදාහැරීමේදී කළවැඩ වාර්තාවන් පදනම් කරගෙන මුදල් නිදහස් කිරීම සිදුකර නොතිබුණු බැවින් නිදහස් කර ඇති මුදල් ප්‍රමාණයට සාපේක්ෂව කළ වැඩ ප්‍රමාණවත් ලෙස සිදුවී ඇත්ද යන්න පරීක්ෂා කිරීමට නොහැකි විය.

(v) මෙම ඉදිකිරීම් 2010 හා 2011 වර්ෂවලදී ආරම්භ කර තිබුණද 2014 වන විටත් වැඩ නිම කර නොතිබුණි.

(ඈ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (ආ) යටතේ ශ්‍රී ලංකා රුපියල් 500,000 ඉක්මවන භාණ්ඩ හෝ සේවා කොන්ත්‍රාත්තුවක් සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කළයුතු වුවද රු. 11,736,772 ක් වටිනා කොන්ත්‍රාත් 05 ක් සඳහා එසේ ගිවිසුම් අත්සන් කර නොතිබුණි.

**2.11 වංචනික ස්වරූපයේ ගනුදෙනු**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ වංචනික ස්වරූපයේ ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) මුලතිවු තැපැල් ස්ථානාධිපති විසින් රු. 1,663,965 ක මුදල් ඌනතාවයක් සිදුකර ඇති බව අභ්‍යන්තර විගණන අංශය මගින් වාර්තා කර තිබුණද නිලධාරියා සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු පරීක්ෂණයක් සිදුකර එමගින් විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) ව්‍යාජ ලෙස පිළියෙල කරන ලද ආපදා ණය වවුචර් පත් දෙකක් උපයෝගී කරගෙන රු. 290,000 ක මුදල් වංචාවක් කළුතර දිසා ගිණුම් කාර්යාලයේදී සිදුකර තිබුණි.

## 2.12 කළමනාකරණ‍දුර්වලතා

---------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) රාජගිරිය හා හැවුලොක් ටවුම තැපැල් කාර්යාලීය සන්නිවේදන පියස් සේවාවන් ක්‍රියාත්මක නොවන බව නියැදි පරීක්ෂණයේදී අනාවරණය විය.

(ආ) මාලබේ තැපැල් කාර්යාල සන්නිවේදන පියසෙහි දෛනික විකුණුම් පිළිබඳව කිසිදු සටහනක් තැපැල් ස්ථානාධිපතිවරයා විසින් තබා නොගැනීම හේතුවෙන් දෛනික දළ ආදායමක් සන්නිවේදන පියස ආදායම ලෙස දිසා ගිණුම් කාර්යාලයට ප්‍රේෂණය කර තිබුණි.

(ඇ) කළුතර තැපැල් කාර්යාලය මගින් උප තැපැල් කාර්යාලවලට මුදල් ප්‍රේෂණය කිරීමේදී තැපැල් මළු තුලට මුදල් බහාලමින් ප්‍රවාහනය සඳහා ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් රථ රියදුරු හා කොන්දොස්තර හට තැපැල් මළු භාර දෙනු ලබන බව අනාවරණය විය. ප්‍රධාන තැපැල් කාර්යාලයෙන් උප තැපැල් කාර්යාලය වෙත මුදල් ප්‍රේෂණය කිරීම සඳහා වඩා ආරක්ෂිත ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු වුවත් එවැනි ක්‍රමවේදයක් තැපැල් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කර නොතිබුණි. 2013 අගෝස්තු මාසය තුලදී අවස්ථා 06 කදී රු. 555,000 ක් එසේ බස්රථ මගින් ප්‍රවාහනය කර තිබුණි.

(ඈ) රු. 4,650,000 ක් වටිනා ජාතික ඉතිරි කිරීමේ ලේබල් පත් 93 ක් 2010 වසරේ සිට ආපසු කළුතර තැපැල් කාර්යාලයේ පැවතුණි.

(ඉ) කළුතර දිසා ගිණුම් කාර්යාලයේ අතිකාල පැය ගණන ගණනය කිරීමේදී වේලා සටහන් යන්ත්‍රයෙහි පැමිණීමට හා පිටවීමට අදාල තොරතුරු පදනම් කර නොගන්නා අතර එක් එක් නිලධාරියා තම තමන්ට අභිමත වේලාවන් සටහන් කර අතිකාල පැය ගණන ගණනය කර අතිකාල මුදල් ඉල්ලුම් කර තිබූ අතර ඒවාට ගෙවීම් කර තිබුණි.

(ඊ) කාර්යාල කටයුතු ප්‍රාදේශීය තැපැල් අධිකාරීගේ අධීක්ෂණයට නිරන්තරයෙන්ම භාජනය විය යුතු වුවත් බොරැල්ල තැපැල් කාර්යාලය 2013 වර්ෂයේ ජනවාරි සිට සැප්තැම්බර් මාසය දක්වා එකම දිනයකවත් අධීක්ෂණයක් සිදුවී නොතිබුණි.

(උ) තැපැල් කාර්යාල සඳහා ලබා දී තිබූ මුද්දර සීමාව ඉක්මවා අතිරික්ත මුද්දර තොග පවත්වා තිබූ බව නියැදි පරීක්ෂණයේදී අනාවරණය විය. විස්තර පහත දැක්වේ.

| තැපැල් කාර්යාලය | විගණනයට භාජනය කළ කාලය | මුද්දර සීමාව | මුද්දර සීමාව ඉක්මවීම |
|---|---|---|---|
| | | රු. | රු. |
| බත්තරමුල්ල | 2013 අගෝස්තු 10 සිට සැප්තැම්බර් 07 දක්වා | 1,800,000 | 17,260,920 |
| කළුතර | 2013 අගෝස්තු මස | 2,100,000 | 4,709,325 |
| බොරැල්ල | 2013 අගෝස්තු 10 සිට සැප්තැම්බර් 10 දක්වා | 5,000,000 | 29,967,570 |
| ගම්පහ | 2013 සැප්තැම්බර් | 8,500,000 | 3,182,345 |

(ඍ) තැපැල් කාර්යාල සඳහා ලබාදී තිබූ මුදල් අග්‍රිම සීමාව ඉක්මවා අතිරික්ත මුදල් පවත්වා තිබූ බව නියැදි පරීක්ෂණයේදී අනාවරණය විය. විස්තර පහත දැක්වේ.

| තැපැල් කාර්යාලය | විගණනයට භාජනය කළ කාලය | මුදල් අග්‍රිම සීමාව | ඉක්මවීම |
|---|---|---|---|
| | | රු. | රු. |
| බත්තරමුල්ල | 2013 අගෝස්තු 10 සිට සැප්තැම්බර් 07 දක්වා | 150,000 | 12,303,000 |
| කළුතර | 2013 අගෝස්තු මස | 450,000 | 6,891,450 |
| බොරැල්ල | 2013 ආගෝස්තු | 1,500,000 | 3,478,451 |
| ගම්පහ | 2013 සැප්තැම්බර් | 450,000 | 14,545,465 |

**2.13 මානව සම්පත් කළමනාකරණය**

**-------------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**-----------------------------------------------------**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 121 | 78 | 43 |
| තෘතීයික මට්ටම | 147 | 68 | 79 |
| ද්විතීක මට්ටම | 8,854 | 7,804 | 1,050 |
| ප්‍රාථමික මට්ටම | 12,871 | 12,162 | 709 |
| වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 4,788 | 4,788 | - |
| එකතුව | 26,781 | 24,900 | 1,881 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වනවිට පුරප්පාඩු 1,881 ක් පිරවීමට ආයතනය අපොහොසත් වී තිබුණි.

(ආ) බත්තරමුල්ල තැපැල් කාර්යාලයට අයත් ලිපි බෙදාහරින කළාප 20 ක් සඳහා තැපැල්කරුවන් 20 දෙනෙකු කාර්යාලයට අනුයුක්ත කර සිටියද අනුමත කාර්යය මණ්ඩලයට තැපැල්කරුවන් 14 දෙනෙකු පමණක් ඇතුළත් කර තිබුණි. කාර්යාලයේ අවශ්‍යතාවය මත අනුමත කාර්යය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.